**ඔබ්සවර් ජොබ්ස් (පුද්ගලික) සමාගම - 2016**

------------------------------------------------------

ඔබ්සවර් ජොබ්ස් (පුද්ගලික) සමාගමේ (“සමාගම”) 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරිමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

---------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්ව (කු ම ප අ සඳහා ශ්‍රී ලං මු වා ප්‍ර) සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ (“මණ්ඩලය”) වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.
මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරි වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.
මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

--------------------------------------------

(අ) 2016 ජනවාරි 01 දිනට මව් සමාගමේ ගිණුම්වල ගෙවිය යුතු ලෙස පෙන්නුම් කරන ලද රු.4,496,257 ක් පොත්වලින් ලියාහැරීමට අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් 2016 පෙබරවාරි 08 දිනදි ගෙන තිබුණි. මෙම ශේෂය සමාලෝචිත වර්ෂය තුළ රදවාගත් ලාභයට බැර කර තිබුණ ද කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්ව (කුමපඅ සඳහා ශ්‍රීලංමුවාප්‍ර) සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි වගන්ති 3.2 (අ) ප්‍රකාරව විධිමත් හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

(ආ) කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්ව (කුමපඅ සඳහා ශ්‍රීලංමුවාප්‍ර) සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි වගන්ති 10.21 පරිදි, 2015 දෙසැම්බර් මාසයට අදාළ නමුත් 2016 පෙබරවාරි මාසයේදී ගෙවන ලද වැටුප් හා වේතන රු.120,746 ක වටිනාකමක් අතීතයානුයෝගීව නැවත ප්‍රකාශ කිරීම් සිදුකර නොතිබුණි.

(ඇ) පරිගණක සඳහා වූ ක්ෂය වටිනාකම රු.28,181 ක් වුවද, එය රු.18,788 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා රු.9,393 න් අඩුවෙන් සටහන් වී තිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන
-----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම විස්තර කෙරෙන ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ඔබ්සවර් ජොබ්ස් (පුද්ගලික) සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (කුමපඅ සඳහා ශ්‍රීලංමුවප්‍ර) අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම
--------------------------------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 220 වගන්තිය ප්‍රකාර සමාගමේ ශුද්ධ වත්කම් ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් අඩකට වඩා අඩුවන විට වැඩ කරන දින විස්සක් ඇතුළත දී, කොටස් හිමියන්ගේ අතිවිශේෂ මහා සභා රැස්වීමක් කැඳවා නොතිබුණි.

### 2.3 සමාගමේ අඛණ්ඩ පැවැත්ම
--------------------------------

2014 වර්ෂයේ සිට සමාගමේ ජංගම වත්කම් සහ ජංගම වගකීම් තත්ත්වය විශ්ලේෂණය කිරීමේදී, ඍණ කාරක ප්‍රාග්ධනයක් නිරීක්ෂණය විය. එසේම, එම කාලපරිච්ඡේදයන් සඳහා ශුද්ධ වත්කම් ප්‍රකාශිත ප්‍රාග්ධනය සමග විශ්ලේෂණය කිරීමේදී, ඍණ නුබුන්වත් ආන්තිකයක් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| විස්තර | 2016<br>රු. | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|---|
| ජංගම වත්කම් | 1,212,198 | 185,511 | 185,511 |
| <u>අඩුකළා</u> | | | |
| ජංගම වගකීම් | (5,957,679) | (4,681,768) | (4,679,267) |
| **කාරක ප්‍රාග්ධනය** | **(4,745,481)** | **(4, 496,257)** | **(4,493,756)** |
| ශුද්ධ වත්කම් | (4,619,229) | (4,496,257) | (4,493,756) |
| <u>අඩුකළා</u> | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | (2,500,000) | (2,500,000) | (2,500,000) |
| **නුබුන්වත් ආන්තිකය** | **(7,119,229)** | **(6,996,257)** | **(6,993,756)** |

කෙසේ වුවද, 2017 නොවැම්බර් 16 දින සමාගමේ සභාපති විසින් සමාගම ඇවර කිරීමට හෝ ව්‍යාපාර නවතා දැමීමේ බලාපොරොත්තුවක් කළමනාකරණයට නොමැති බව මා වෙත දන්වා තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

-----------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.4,613,969 ක බදු පූර්ව ශුද්ධ අලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු.2,500 ක බදු පූර්ව ශුද්ධ අලාභයක් වුයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.4,611,469 ක තවදුරටත් පිරිහීමක් දැක්වුණි. පසුගිය වර්ෂයට සාපේක්ෂව වැටුප් හා වේතනවල කැපීපෙනෙන වර්ධනය සහ ආදායම ඉහළ නොයාම, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපෑ හේතු වී තිබුණි.

2016 වර්ෂය සඳහා වැටුප්, බදු සහ ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමෙන් පසු සමාගමේ අගය එකතුකිරීම රු.842,086 ක් ලෙස වාර්තා වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**4.1 මෙහෙයුම් දුර්වලතා**

----------------------

සමාලෝචිත වර්ෂය සඳහා වැටුප් හා වේතන ගෙවීම රු.5,437,267 ක් හෙවත් සියයට 322 න් වර්ධනය වී තිබුණි. එම නිසා, ප්‍රවර්තන වියදම් ආවරණය කරගැනීම සඳහා මව් සමාගම විසින් සමාලෝචිත වර්ෂය තුළ රු.10,294,822 ක් සමාගමට සපයා තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහ පාලනය**

-----------------------------------------

**5.1 සංයුක්ත සැලැස්ම**

---------------------

සංයුක්ත සැලැස්ම අස්තිත්වයේ අනාගත කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය සහ ඉහළ කළමනාකරණයේ කැපවීම පෙන්වන පිළිබිඹුවකි. කෙසේවුවද, 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී/12 හි වගන්ති 5 අනුව, සමාගම ආරම්භයේ සිටම සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**6. පද්ධති හා පාලන**

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා සමාගමේ සභාපතිගේ අවධානයට වරින් වර යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතු වේ.

| | පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | කාරක ප්‍රාග්ධන කළමනාකරණය | වගකීම් ගෙවා දැමීම සඳහා මෙහෙයුම් මුදල් ප්‍රවාහ ලැබීම ඉහළ දැමීම |
| (ආ) | වියදම් පාලනය | වැටුප් හා වේතන අඩුකිරීම හෝ ආදායම් ඉහළ නැංවීම |